රුහුණ විශ්වවිද්‍යාලය

**2018/2019 අධ්‍යයන වර්ෂය**
**ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2020 මාර්තු - අගෝස්තු**

**ACL 22623 – පුරාවිද්‍යාවේ න්‍යායාත්මක දෘෂ්ටිය**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**
**අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකිය.**

**කාලය: පැය 03**

---

01. 1960 දශකයෙන් ආරම්භ වූ පුරාවිද්‍යාවේ නව ප්‍රවේශය 'නව පුරාවිද්‍යාව' (New Archaeology) ලෙස හැඳින්විය හැකිද? 1940 - 1950 දශකවල පුරාවිද්‍යාව තුළ සිදු වූ වර්ධනයන් ඇසුරින් සාකච්ඡාවට භාජනය කරන්න.

02. නව පුරාවිද්‍යාව (New Archaeology) බිහිවීමට පදනම් වූ සාම්ප්‍රදායික පුරා විද්‍යාවේ (Traditional Archaeology) ප්‍රධාන දුර්වලතා ගෙන හැර දක්වන්න.

03. නව පුරාවිද්‍යා ප්‍රවේශය පුරාවිද්‍යාවට එකතු කළ නව ප්‍රවනතා හා එහි මූලික ලක්ෂණ විමසීමට ලක් කරන්න.

04. මානවීය විද්‍යාවක් වන පුරාවිද්‍යාවට අයෝග්‍ය අවිචාරවත් 'විද්‍යා උන්මාදයක්' හා 'කෘත්‍යවාදී ප්‍රවේශයක්' හඳුන්වා දීම නිසා නව පුරාවිද්‍යාව පශ්චාත් නව පුරාවිද්‍යාවේ (Postprocessual Archaeology) දැඩි විවේචනයට ලක් වූ අයුරු සාකච්ඡා කරන්න.

05. පශ්චාත් නව පුරාවිද්‍යාවේ (Postprocessual Archaeology) ප්‍රධාන සංකල්ප හා මූලික ලක්ෂණ ගෙනහැර දක්වන්න.

06. අතීත පරිසරය හා ජීවනෝපාය නැවත ගොඩනැගීම පිළිබඳ පුරාවිද්‍යාවේ පුරෝගාමී අධ්‍යයන සමාලෝචනය කරන්න.

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට (02) ප්‍රමාණවත් සටහන් ලියන්න.

   i. පරිශ්‍ර පෝෂක විශ්ලේෂණය (Site Catchment Analysis)
   ii. පුරාවිද්‍යාවේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන (Gender Archaeology)
   iii. මානවවංශ පුරාවිද්‍යා නිදර්ශන (Ethnoarchaeological Analogies)
   iv. ප්‍රජානන පුරාවිද්‍යාව (Cognitive Archaeology)

@@@@@@@@